**රඹෑව ප්‍රාදේශීය සභාව**
**අනුරාධපුර දිස්ත්‍රික්කය**
**---------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන **පිළිබඳ** විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 සැප්තැම්බර් 25 දින සභාපතිවරයා වෙත යවා ඇත.

## 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට රඹෑව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳව අදහස් දැක්වීම

### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ව්‍යාපෘති 05 ක් ඉටුකිරීම වෙනුවෙන් ගෙවිය යුතු රු. 97,928 ක අතරුඳවුම් මුදල් ණයගැතියෝ යටතේ ගිණුම්ගත කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ණයගැතියෝ එම වටිනාකමෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ විගණන ගාස්තු වෙනුවෙන් වෙන්කිරීම් කර නොතිබුණි.

(ඇ) සංවර්ධන ව්‍යාපෘති 04 කට අදාල තත්ත්ව වාර්තා ඉදිරිපත් කරන තෙක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලැබිය යුතු හා සභාව විසින් කොන්ත්‍රාත්කරුට ගෙවිය යුතු රු.2,451,085 ක් ණයගැතියෝ හා ණයහිමියෝ යටතේ ගිණුම්ගත නොකිරීම හේතුවෙන් ජංගම වත්කම් හා ජංගම වගකීම් එම වටිනාකමෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) ව්‍යාපෘති 09 ක් ඉටුකිරීම වෙනුවෙන් සභාවට ලැබී තිබුණු එකතුව රු.366,000 ක් ණයගැතියෝ යටතේ දැක්වීම හේතුවෙන් ණයගැතියෝ එම වටිනාකමෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඉ) එකතුව රු.29,697,850 ක් වූ කර්මාන්ත ණයගැතියෝ හා එකතුව රු. 29,728,674 ක කර්මාන්ත ණයහිමියෝ සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන ලැබීම් හා ප්‍රාග්ධන ගෙවීම් යටතේ ගිණුම්ගතකර නොතිබීම හේතුවෙන් ප්‍රාග්ධන ලැබීම් සහ ගෙවීම් ගිණුම් එම වටිනාකමෙන් අඩුවෙන් දක්වා තිබුණි

(ඊ) සමාලෝචිත වර්ෂය තුල ඉටු කරන ලද ව්‍යාපෘති 06 ක ණයගැති හා ණයහිමි වටිනාකම් නිවැරදි ලෙස ගිණුම්ගත නොකිරීම හේතුවෙන් කර්මාන්ත ණයගැතියෝ රු.2,236,302 කින් හා ණයහිමියෝ රු.1,105,477 කින් වැඩියෙන් දක්වා තිබුණි.

### 1.3.2 නොසැසඳුණු ගිණුම්

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් හිඟහිටි වරිපනම් ශේෂය හා ඊට අදාල උපයෝගී ලේඛනවල දැක්වෙන ශේෂය අතර රු.113,057 ක නොසැසඳීමක් නිරීක්ෂණය විය.

1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

(අ) ලැබිය යුතු ගිණුම්

වර්ෂ ගණනාවක සිට පැවත එන එකතුව රු.584,794 ක් වූ ලැබිය යුතු ගිණුම් ශේෂ 06 ක් සමාලෝචිත වර්ෂයේදී ද අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ගෙවිය යුතු ගිණුම්

වර්ෂ ගණනාවක සිට පැවත එන රු.865,218 ක්වූ ගෙවිය යුතු ගිණුම් ශේෂ 09 ක් සමාලෝචිත වර්ෂයේදී නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

1.3.4 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.63,931,275 ක්වූ ගිණුම් විෂයයන් 04 ක් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.1,761,489 ක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන ආදායම ඉක්මවූ වියදම රු.2,091,434 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම් ,තත්‍ය ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ බිල්කළ ආදායම්,රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් වර්ගය | 2017 ජනවාරි දිනට 01 ආරම්භක ශේෂය | 2017 වර්ෂයේ බිල්කල ආදායම | 2017 රැස්කළ ආදායම | | 2017 දෙසැම්බර් දිනට 31 හිඟහිටි ආදායම |
|---|---|---|---|---|---|
| | වටිනාකම | වටිනාකම | 2017.01.01 හිඟය වටිනාකම | 2017 බිල්කළ මුදලින් වටිනාකම | වටිනාකම |
| | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් | 468,920 | 645,000 | 104,981 | 365,812 | 643,128 |
| උසාවි දඩ | 105,580 | 869,996 | - | - | 975,576 |
| කඩකුලී | 54,000 | 628,900 | 54,000 | 613,400 | 15,500 |
| මුද්දර ගාස්තු | 497,700 | 60,000 | - | - | 557,700 |
| ටෙන්ඩර් මත කුලී | 1,917,801 | 2,427,101 | 88,625 | 2,427,101 | 1,829,176 |
| එකතුව | 3,044,001 | 4,630,997 | 247,606 | 3,406,313 | 4,021,080 |

2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්ය සාධනය

-----------------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) වරිපනම් හා බදු

-------------------

සමාලෝචිත වර්ෂය ආරම්භයේ පැවති රු. 468,920 ක හිඟ වරිපනම් වලින් වර්ෂය තුළ රු.104,980 ක් අයකරගෙන තිබුණු අතර හිඟ මුදල් අයකර ගැනීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනතේ 158 වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) උසාවි දඩ හා මුද්දර ගාස්තු

-----------------------------

සමාලෝචිත වර්ෂය වෙනුවෙන් මුද්දර ගාස්තු නිශ්චිතව හඳුනා ගැනීමකින් තොරව රු. 60,000 ක් පමණක් ගිණුම්ගත කර තිබුණු අතර 2017 වර්ෂය ආරම්භයේ පැවති රු. 497,000 ක ලැබිය යුතු මුද්දර ගාස්තු පළාත් සභාවෙන් ලබාගැනීමට කටයුතු කර නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

---------------------------

3.1 කාර්යසාධනය

---------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය,පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා, විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

----------------

ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 28ක් ඉටු කිරීම සඳහා උතුරු මැද පළාත් සභාවේ විෂයභාර අමාත්‍යවරයා විසින් 2016 මාර්තු 30 දින අංක 1960/35 දරන ගැසට් පත්‍රයේ පලකරන ලද අතුරු ව්‍යවස්ථා සභාව වැළඳගෙන ඇතත් එය නීත්‍යානුකූල කර ගැනීම සඳහා සභාව විසින් ගැසට් නිවේදනයක් පලකර නොතිබුණි.

(ආ) ක්‍රියාකාරී සැලැස්ම

-------------------

සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් වෙනුවෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

(ඇ) අත්හැර දැමූ කර්තව්‍යයන්

----------------------------

ග්‍රාමීය ප්‍රදේශවල මාර්ග කී.මී.1,000 ක් සංවර්ධනය කිරීමේ වැඩසටහන යටතේ රත්මල්ගහවැව ප්‍රධාන මාර්ගයේ සිට සියඹලාගස්වැව ගම හරහා නැවත රත්මල්ගහවැව ප්‍රධාන මාර්ගය දක්වා වූ සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය රු.4,108,979 කට කොන්ත්‍රාත්කාර ආයතනයකට ගිවිසුමකින් තොරව පවරා තිබුණු අතර මාර්ගයේ මීටර් 750 ක දුර ප්‍රමාණයක ABC අතුරා බොරළු යොදා උරහිස් සකස් කර තිබුණි. ඉන් පසු මාර්ගය පිළිසකර කිරීම අත්හැර තිබුණි.

(ඈ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

-------------------------------

පිලිසරු ව්‍යාපෘතිය සඳහා වර්ග කිරීමකින් තොරව රැගෙන එන කසල වෙන්කර ගැනීමට සභාවට අමතර කාලයක් සහ පිරිවැයක් දැරීමට සිදුව තිබූ අතර මෙම ව්‍යාපෘතියෙන් නිපදවන කොම්පෝස්ට් පොහොර අලෙවි කිරීම සඳහා ක්‍රමවත් වැඩපිළිවෙලක් සකස්කර නොතිබුණි.

(ඉ) තිරසර සංවර්ධනය

---------------------

එක්සත් ජාතීන්ගේ සංවිධානයේ තිරසාර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රය පිළිබඳව සභාව දැනුවත් බව දන්වා තිබුණු නමුත් එම අරමුණු ඉටුකරගත හැකි අයුරින් සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම සකස්කර නොතිබුණි.

3.2 මානව සම්පත් කළමනාකරණය

-----------------------------------

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 29/2014 ට පටහැනිව සේවකයින් 14 දෙනෙකු 2014 ඔක්තෝබර් 24 දින සිට සේවයේ යොදවා 2016 මැයි 31 දින දක්වා රු.7,602,604 ක මුදලක් වැටුප් ලෙස ගෙවා තිබුණි.

3.3 වත්කම් කළමනාකරණය

------------------------------

නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

-------------------------------------------

සභාව සතු වටිනාකම රු.856,800 ක්වූ වත්කම් ඒකක 03 ක් භාවිතයට නොගැනීම හේතුවෙන් වර්ෂ ගණනාවක් තිස්සේ නිශ්කාර්යව පැවතුණි.

4 ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

---------------------------------------

4.1 අයවැය පාලනය

-----------------

නිසි පුරෝකථනයකින් තොරව අයවැය ඇස්තමේන්තු සකස් කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ආදායම් විෂයන් 06 ක අයවැයගත ආදායම හා තත්‍ය ආදායම අතර සියයට 12 සිට සියයට 62 දක්වා විචලනයන් සහ වියදම් විෂයන් 05 ක අයවැයගත වියදම හා තත්‍ය වියදම අතර සියයට 22 සිට සියයට 64 දක්වා විචලනයන් නිරීක්ෂණය විය. ඒ අනුව අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

4.2 විගණන හා කළමනාකරණ කමිටු

--------------------------------------

2009 ජුනි 09 දිනැති අංක DMA 2009 (1) දරන කළමනාකරණ හා විගණන දෙපාර්තමේන්තුව විසින් නිකුත්කර ඇති චක්‍රලේඛයට අනුව 2017 වර්ෂය සඳහා විගණන හා කළමනාකරණ කමිටු ස්ථාපිතකර නොතිබුණි.

5. පද්ධති හා පාලනය

---------------------

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමුකර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළයුතුය.

| | පද්ධතිය | අඩුපාඩුව |
|---|---|---|
| (අ) | ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම් | නිසි පරිදි හඳුනාගෙන නිරවුල් නොකිරීම. |
| (ආ) | අභ්‍යන්තර පාලනය | (i) අභ්‍යන්තර විගණනය ක්‍රියාත්මක නොකිරීම. |
| | | (ii) විගණන හා කළමනාකරණ කමිටු නොපැවැත්වීම. |
| (ඇ) | ඝන අපද්‍රව්‍ය කළමනාකරණය | දිරාපත් නොවන ඝන අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණයට කටයුතු නොකිරීම. |
| (ඈ) | සේවක කළමනාකරණය | පුරප්පාඩු සම්පූර්ණ කර නොගැනීම. |